සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය – 2016
## (කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2017/2019)

**(01) කෘෂිකර්මය** — පැ. එකයි

---

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.....................................

වැදගත් :

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **07** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.
- ✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.
- ✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
- ✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
- ✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
- ✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- ✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

### පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 10 | |
| 3 | 11 - 16 | |
| 4 | 17 - 25 | |
| 5 | 26 - 34 | |
| 6 | 35 - 42 | |
| 7 | 43 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

- අංක **1** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. ලෝක පරිසර දිනය
   (1) ජනවාරි 15 වැනි දා ය. (2) අප්‍රේල් 22 වැනි දා ය.
   (3) මැයි 22 වැනි දා ය. (4) ජූනි 05 වැනි දා ය. (………)

2. ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබුවේ
   (1) 1912 දී ය. (2) 1922 දී ය. (3) 1932 දී ය. (4) 1942 දී ය. (………)

3. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධන වේගය
   (1) 3.2% කි. (2) 4.3% කි. (3) 5.4% කි. (4) 6.5% කි. (………)

4. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පැරිස් දේශගුණ සම්මුතිය අපරානුමතිය (ratified) කරනු ලැබුවේ 2016 වසරේ
   (1) අප්‍රේල් 22 වැනි දින දී ය. (2) ජූනි 05 වැනි දින දී ය.
   (3) සැප්තැම්බර් 9 වැනි දින දී ය. (4) සැප්තැම්බර් 22 වැනි දින දී ය. (………)

5. පහත දැක්වෙන අංක සලකන්න.
   1 , 3 , 9 , 4 , 10 , 13 , 2 , 6
   ඉහත දත්ත ගොනුවේ මධ්‍යන්‍යය සහ මධ්‍යස්ථය වන්නේ පිළිවෙළින්
   (1) 5 සහ 4 ය. (2) 6 සහ 5 ය. (3) 8 සහ 5 ය. (4) 10 සහ 8 ය. (………)

6. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍ර තුන අතුරින්, කෘෂිකර්ම ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට වැඩිම දායකත්වය දක්වයි.
   (2) පුරාණ රජවරුන් විසින් වැව් ඉදිකරනු ලැබුවේ දේශගුණික විචලතා මගින් ඇති වන බලපෑම් මග හරවා ගැනීමට ය.
   (3) හරිත විප්ලවය දේශීය වී වර්ගවල ප්‍රවර්ධනය සඳහා ඉවහල් විය.
   (4) වර්තමානයේ දී, ශ්‍රී ලංකාව සීනි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත ය. (………)

7. කාලගුණ මධ්‍යස්ථානයක අනිලමානය මගින් මනිනු ලබන්නේ
   (1) සුළගේ දිශාව ය. (2) සුළගේ වේගය ය.
   (3) සාපේක්ෂ ආර්ද්‍රතාව ය. (4) වායුව උෂ්ණත්වය ය. (………)

8. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) වී වගාවේ නිෂ්පාදකතාව යල කන්නයට සාපේක්ෂව මහ කන්නයේ දී වැඩි ය.
   (2) සමස්ත වී නිෂ්පාදනය මහ කන්නයට වඩා යල කන්නයේ දී වැඩි ය.
   (3) සාමාන්‍යයෙන් යල කන්නයේ වී වගාවට වල් පැළෑටි මගින් ඇති වන තරගය මහ කන්නයට වඩා වැඩි ය.
   (4) නියමිත කාලයේ වගා කිරීමේ දී, ගොවීන් විසින් යල කන්නයේ දී වැඩි වයස් වී වර්ග ද, මහ කන්නයේ දී අඩු වයස් වී වර්ග ද යොදා ගනී. (………)

9. දිගු දින ශාකයක
   (1) වර්ධක වර්ධනයේ වැඩිවීම සඳහා කෙටි දින අවශ්‍ය වේ.
   (2) පුෂ්ප ඇතිවීම සඳහා දිගු දින අවශ්‍ය වේ.
   (3) වර්ධක වර්ධනයේ වැඩිවීම සඳහා කෙටි දින ද පුෂ්ප ඇතිවීම සඳහා දිගු දින ද අවශ්‍ය වේ.
   (4) වර්ධක වර්ධනයේ වැඩිවීම සඳහා දිගු දින ද පුෂ්ප ඇතිවීම සඳහා කෙටි දින ද අවශ්‍ය වේ. (………)

10. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය
    (1) මිලිමීටර 300 ට අඩු ය. (2) මිලිමීටර 900 ට අඩු ය.
    (3) මිලිමීටර 1750 ට අඩු ය. (4) මිලිමීටර 2500 ට අඩු ය. (………)

[ 3 වැනි පිටුව බලන්න.

● අංක **11** සහ **12** යන ප්‍රශ්න සඳහා පහත දැක්වෙන පාංශු පැතිකඩක රූපසටහන යොදා ගන්න.




11. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) කෘෂිකාර්මික බිම්වල *O* කලාපයේ ඝනකම වැඩි ය.
   (2) ස්වාභාවික වනාන්තරවල *A* කලාපයේ ඝනකම වැඩි ය.
   (3) *A* සහ *B* කලාප දෙකම එක්ව මතුපිට පස් ලෙස හඳුන්වනු ලැබේ.
   (4) *R* කලාපය මැටි අංශුවලින් පෝෂිත ය. (.........)

12. *C* කලාපය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) එය ජීර්ණය නොවූ මාතෘ පාෂාණවලින් සමන්විත වේ.
   (2) එය පාංශු ජනනය තුළින් *B* කලාපය නිර්මාණය කිරීමට දායක වේ.
   (3) එය පාංශු ජනනය තුළින් *A* සහ *B* කලාප නිර්මාණය කිරීමට දායක වේ.
   (4) එහි කාබනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අන්තර්ගත වේ. (.........)

13. ද්‍රාවණයක් සම්බන්ධව පහත කරුණු සලකන්න.
   A - හයිඩ්‍රජන් අයනවල මවුල සාන්ද්‍රණය
   B - අම්ලයක් උදාසීන කිරීමේ ප්‍රමාණාත්මක ධාරිතාව
   C - දියවී ඇති ලවණ ප්‍රමාණය

   ඉහත කරුණු අතුරින් ද්‍රාවණයක භාෂ්මිකතාව විස්තර කෙරෙන්නේ,
   (1) A මගින් පමණි. (2) B මගින් පමණි.
   (3) C මගින් පමණි. (4) A සහ C මගින් පමණි. (.........)

14. නිරෝගී පුද්ගලයකුගේ රුධිරයේ pH අගය
   (1) 5.75 - 6.15 අතර වේ. (2) 6.55 - 6.95 අතර වේ.
   (3) 7.35 - 7.45 අතර වේ. (4) 7.55 - 8.15 අතර වේ. (.........)

15. වී, බඩඉරිඟු සහ කුරක්කන් යන බෝග අයත් වන ශාක කුලය කුමක් ද?
   (1) පොඒසියේ (2) ලෙගියුමිනෝසියේ
   (3) කුකුර්බිටේසියේ (4) සොලනේසියේ (.........)

16. බීජ සුප්තතාව වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ
   (1) සුදුසු පාරිසරික තත්ත්ව ලබාදෙන තුරු යම් නිශ්චිත කාල සීමාවක ජීවී බීජ ප්‍රරෝහණය නොවීම ලෙස ය.
   (2) ප්‍රරෝහණයට සුදුසු පාරිසරික තත්ත්ව තුළ ජීවී බීජ ප්‍රරෝහණය නොවීම ලෙස ය.
   (3) තද බීජාවරණයක් හේතුවෙන් පරිණත ජීවී බීජ නිශ්චිත කාල සීමාවක ප්‍රරෝහණය නොවීම ලෙස ය.
   (4) සුදුසු පරිසර තත්ත්ව තිබුණ ද පරිණත ජීවී බීජ ප්‍රරෝහණය නොවීම ලෙස ය. (.........)

17. වර්ධක ප්‍රචාරණයේ වාසියක් වන්නේ
    (1) දෙමුහුම් දිරියෙන් යුත් ශාක නිපදවීම ය.
    (2) ගහනය තුළ ජානමය විවිධත්වය වැඩි වීම ය.
    (3) ශාක ගහනයේ ඒකාකාරී බව ඇතිවීම ය.
    (4) ඵල නිෂ්පාදනයට ගතවන කාලය අඩුවීම ය. (.........)

18. රාත්‍රි අන්ධතාවය, ඇස්වල බිටෝලප ඇතිවීම, ඇස් වියළි භාවයෙන් යුක්ත වීම යන ලක්ෂණ ඇති වන්නේ කුමන විටමින් වර්ගයේ ඌනතාවෙන් ද?
    (1) විටමින් A (2) විටමින් B (3) විටමින් C (4) විටමින් D (.........)

19. පළිබෝධ නාශක අසුරනයක ලේබලයෙහි නිල් හෝ කොළ හෝ කහ හෝ රතු වර්ණ තීරුවක් යෙදීමෙන් සංකේතවත් කරනු ලබන්නේ
    (1) පළිබෝධ නාශකයේ විෂදායී බවයි.
    (2) පළිබෝධ නාශකයේ කල් ඉකුත් වන දිනයයි.
    (3) පළිබෝධ නාශකය මගින් විනාශ කරනු ලබන පළිබෝධ වර්ගයයි.
    (4) පළබෝධ නාශකය වල් නාශක ද කෘමි නාශක ද යන්නයි. (.........)

20. යූරියාවල රසායනික ව්‍යුහය වන්නේ
    (1) $NH_4CI$ ය. (2) $NH_2CONH_2$ ය.
    (3) $NH_4CONH_4$ ය. (4) $(NH_4)_2HPO_4$ ය. (.........)

21. ශාක පෝෂණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A - යොදන පොහොරවල ආකාරයේ බලපෑමෙන් තොරව, ශාක මගින් නයිට්‍රජන් අවශෝෂණය කරන්නේ $NO_3^-$ සහ $NH_4^+$ ආකාරවලට ය.
    B - 2013 සිට, ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වී වගාවේ මූලික පොහොරක් ලෙස යූරියා නිර්දේශ නොකරයි.
    C - ශ්‍රී ලංකාවේ බෝග වගාවට නයිට්‍රජන් පොහොරක් ලෙස නිර්දේශ කර ඇත්තේ යූරියා පමණි.
    ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,
    (1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි. (4) B සහ C පමණි. (.........)

22. මානව පෝෂණයේ දී ප්‍රෝටීනවල කාර්යය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) සිරුරේ උෂ්ණත්වය පාලනය කරයි.
    (2) මිනිස් සිරුරේ ජල තුලනය පාලනය කරයි.
    (3) විටමින් A, B, E සහ K සඳහා වාහකයක් ලෙස ක්‍රියා කරයි.
    (4) කාබෝහයිඩ්රේට් සහ ලිපිඩ සීමාකාරී වන විට ශක්තිය සැපයීමට ක්‍රියා කරයි. (.........)

23. ජෛව ස්කන්ධ දර්ශකය (BMI)
    (1) මීටරයට කිලෝග්‍රෑම්වලින් දක්වනු ලැබේ.
    (2) වර්ගමීටරයට කිලෝග්‍රෑම්වලින් දක්වනු ලැබේ.
    (3) වර්ගමීටරයට රාත්තල්වලින් දක්වනු ලැබේ.
    (4) සඳහා ඒකක නොමැත. (.........)

24. ගවයින්ගේ කුර සහ මුඛ රෝගයේ රෝග කාරකය වන්නේ
    (1) බැක්ටීරියා ය. (2) වයිරස ය.
    (3) දිලීර ය. (4) නෙමටෝඩාවන් ය. (.........)

25. ශ්‍රී ලංකාවේ පොල් ත්‍රිකෝණය තුළ ඇති කිරීම සඳහා සුදුසු කිරි ගව වරිග වන්නේ
    (1) ජර්සි, අයර්ශයර් සහ AMZ ය. (2) ෆ්‍රීෂියන්, ජර්සි සහ අයර්ශයර් ය.
    (3) ජර්සි, සහිවාල් සහ AMZ ය. (4) සහිවාල්, ෆ්‍රීෂියන් සහ AFS ය. (.........)

26. සාන්ද්‍රිකරණය කිරීම මගින් ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනය අක්‍රීය කර ආහාර පරිරක්ෂණය කරනු ලබන අතර, එහිදී
   (1) ක්ෂුද්‍රජීවී වර්ධනයට අවශ්‍ය ජල සැපයුම අඩු වේ.
   (2) ක්ෂුද්‍රජීවී වර්ධනයට අවශ්‍ය ඔක්සිජන් නොමැති වේ.
   (3) ක්ෂුද්‍රජීවී වර්ධනයට සුදුසු නොවන උෂ්ණත්වයක් ඇති කෙරේ.
   (4) ක්ෂුද්‍රජීවීන්ගෙන් ජලය හානිවීම සිදු වේ. (.........)

27. එළදෙනකගේ සාමාන්‍ය ගැබ්බර කාලය දින
   (1) 200 කි. (2) 285 කි. (3) 315 කි. (4) 365 කි. (.........)

28. ශ්‍රී ලංකාවේ ඇති ජලජ ආගන්තුක ආක්‍රමණශීලී ශාක කාණ්ඩය තෝරන්න
   (1) *Panicum maximum, Mimosa pigra, Salvinia molesta*
   (2) *Salvinia molesta, Eichhornia crassipes, Pistia stratiotes*
   (3) *Eichhornia crassipes, Pistia stratiotes, Echinochloa crusgalli*
   (4) *Pistia stratiotes, Echinochloa crusgalli, Panicum maximum* (.........)

29. ආවර්තිතා වගුවේ දක්නට ඇති බැර ලෝහ කාණ්ඩය තෝරන්න
   (1) Cu, Zn, Cr, Pb (2) Cd, Al, As, Pb
   (3) F, Cd, Al, Pb (4) F, Cd, Al, Zn (.........)

30. බටු ශාක පත්‍රවල නාරටි ඉතිරි වී සැකිල්ලක් සෑදෙන ආකාරයට කා දමන, ඉබි හැඩයෙන් යුක්ත කෘමියා
   (1) අවුලැකපෝරා ය. (2) එපිලැක්නා ය.
   (3) ඉල්මැස්සා ය. (4) පස් මුළු මකුණා ය. (.........)

- අංක **31** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුරු** දී ඇති **තිත් ඉරි** මත ලියන්න.

31. බෝග වර්ගීකරණය යන්න කෙටියෙන් හඳුන්වන්න.

......................................................................................................

......................................................................................................

......................................................................................................

32. වී වගාවේ දී ප්‍රාථමික බිම් සැකසීමේ දී වල් මර්දනය වන ආකාර **දෙකක්** සඳහන් කරන්න.
   (i) ......................................................................................................
   (ii) ......................................................................................................

33. පසෙන් ජලය හානිවන ආකාර **හතරක්** ලැයිස්තුගත කරන්න.
   (i) ......................................................................................................
   (ii) ......................................................................................................
   (iii) ......................................................................................................
   (iv) ......................................................................................................

34. කාලගුණය හා දේශගුණය අතර වෙනස දක්වන්න.

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

35. දේශගුණික විපර්යාසය යනු කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

36. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු දේශගුණික විපර්යාසවලට අනුහුරු වියහැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

37. සමෝධානිත ගොවිතැන යනු කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

38. පස සෑදීමේ ප්‍රධාන ක්‍රියාවලි දෙක සඳහන් කරන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

39. ආහාර 'බිලාන්වීකරණය' යනු කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

40. පලතුරු බීම නිෂ්පාදනය සඳහා නිර්දේශිත පරිරක්ෂක ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

41. ශ්‍රී ලංකාවේ බෝගවල ෆයිටෝප්ලාස්මා (phytoplasma) රෝග සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

42. ශ්‍රී ලංකාවේ පහත සඳහන් පර්යේෂණ සහ සංවර්ධන ආයතන පිහිටා ඇති ස්ථාන නම් කරන්න.

(i) වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය :- ..........................................................................

(ii) ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය :-..........................................................................

(iii) උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය :-..........................................................................

(iv) පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය :-..........................................................................

43. ගවයින් ඇති කිරීමේ සියුම් ක්‍රමයේ (intensive system) ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

(iii) ..............................................................................................................

(iv) ..............................................................................................................

44. ගවයින්ගේ කුර සහ මුඛ රෝගයේ රෝග ලක්ෂණ හතරක් ලැයිස්තුගත කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

(iii) ..............................................................................................................

(iv) ..............................................................................................................

45. කුකුළන්ට වැළඳෙන පුල්ලෝරම් රෝගයේ රෝග කාරකයා නම් කරන්න.

..............................................................................................................

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර** වරහන තුළින් තෝරා, දී ඇති **තිත් ඉර** මත ලියන්න.

46. ශ්‍රී ලංකාව බෙදා ඇති කෘෂි පාරිසරික කලාප ගණන ........................ (7 / 24 / 46) කි.

47. ජලයේ උපරිම පරිමාව සෙල්සියස් අංශක ................................ (4 / 6 / 8) දී ළඟා කරගත හැකි ය.

48. (*Neochetina bruchi / Cyrtobagus salvineae / Pareuchaetus pseudoinsulata* ) ..........................................
................................ යනු ශ්‍රී ලංකාවේ ජපන් ජබර පාලනය කිරීම සඳහා යොදාගෙන ඇති එක් ජෛව පාලකයකි.

49. පොටෑසියම් ක්ලෝරයිඩ් (මියුරියේට් ඔෆ් පොටෑෂ්) තුළ $K_2O$ සියයට .............................. (24 / 46 / 60) ක් අන්තර්ගත වේ.

50. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ ....................
..........................................(වොෂින්ටන් / නිව්යෝක් / කැලිෆෝනියා)වල ය.

* * *

2422

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය – 2016
(කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2017/2019)

## (02) බුද්ධි පරීක්ෂණය

පැ එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4 5**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

වැදගත් :

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු 07 කින් හා ප්‍රශ්න 50 කින් යුක්ත වේ.
- ✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.
- ✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
- ✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.
- ✳ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- ✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
- ✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- ✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 10 | |
| 3 | 11 - 23 | |
| 4 | 24 - 32 | |
| 5 | 33 - 38 | |
| 6 | 39 - 45 | |
| 7 | 46 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

● අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ පද පහක් බැගින් දී ඇත. ඒවා අතුරින් එකක් අනෙක්වාට වඩා කිසියම් ලක්ෂණයකට අනුව වෙනස් ය. එම **වෙනස් ලක්ෂණය** ඇති වචනය තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

1. (1) මුං (2) මෑ (3) කව්පි (4) බෝංචි (5) මුරුංගා (………)

2. (1) ගෝවා (2) අර්තාපල් (3) කැරට් (4) රතුලූණු (5) මඤ්ඤොක්කා (………)

3. (1) කිලෝමීටරය (2) සැතපුම (3) දම්වැල (4) යාරය (5) අඩිය (………)

4. (1) පරිමිතිය (2) පරිමාව (3) විෂ්කම්භය (4) දිග (5) පළල (………)

5. (1) අනුරාධපුරය (2) සීගිරිය (3) තලවිල (4) කතරගම (5) ශ්‍රීපාදස්ථානය (………)

● අංක **6** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ මුලින් සඳහන් පද යුගලය අතර ඇති සම්බන්ධතාවට වඩාත් කිට්ටු සම්බන්ධතාවක් ඇති පද යුගලය දී ඇති වරණ අතුරින් තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

6. කැරට් : දියමන්ති

(1) බෝංචි : එළවළු (2) ලීටර : ඩීසල්
(3) ලකුණු : ඇනුම (4) හාල් : සේරු (………)

7. ඒකකය : භාගය

(1) බින්දුව : එක (2) සියය : ප්‍රතිශතය
(3) පූර්ණ සංඛ්‍යාව : දශමය (4) වර්ගය : වර්ගමූලය (………)

8. කෘෂිකර්මය : කෘෂිවිද්‍යාව

(1) අධ්‍යාපනය : මනෝවිද්‍යාව (2) ව්‍යාපාර : කළමනාකරණය
(3) රංගනය : රංග කලාව (4) ඉවුම්පිහුම් : සූප ශාස්ත්‍රය (………)

9. ඊසාන : නිරිත

(1) බටහිර : උතුර (2) වයඹ : ගිනිකොණ
(3) දකුණ : නැගෙනහිර (4) වයඹ : නිරිත (………)

10. විවාහය : කලත්‍ර

(1) දික්කසාදය : ස්වාධීනත්වය (2) සහයෝගය : මිත්‍ර
(3) විසංවාදය : අරගලය (4) ප්‍රසූතිය : දෙගුරු (………)

● අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නය පහත දැක්වෙන රූපසටහන හා විස්තරය මත පදනම් වේ.

ගොවියකු වගා කරන කුඹුරක සැලැස්මක් මෙහි දැක්වේ. සමචතුරස්‍ර හැඩයක් ඇති මෙම කුඹුරෙහි පැත්තක් මීටර 5 ක් වූ සමචතුරස්‍ර ලියැදි 4 කි. එම ලියැදි වෙන් වී ඇති මායිම් නියරෙහි පළල සෑම ස්ථානයකම මීටර 1 කි.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.



11. කුඹුරේ ලියැදි හතරට අයත් භූමි ප්‍රමාණය වර්ගමීටර කීය ද?

(1) 64 (2) 80 (3) 100 (4) 120 (.........)

12. කුඹුරේ නියරවලට අයත් භූමි ප්‍රමාණය වර්ගමීටර කීය ද?

(1) 40 (2) 44 (3) 48 (4) 69 (.........)

13. කුඹුරේ එක් එක් ලියැද්දක මායිම්වලින් සෙන්ටිමීටර 10 ක් ඇතුළට වන සේ ගොයම් පැළ සිටුවන ලදී. සෑම ගොයම් පැළ දෙකක් අතර තිරස් අතට හෝ සිරස් අතට පරතරය සෙන්ටිමීටර 10 කි. ලියැදි හතරේ ම සිටුවීම සඳහා අවශ්‍ය මුළු පැළ ගණන සෙවීමේ නිවැරදි ක්‍රමය මින් කුමක් ද?

(1) $50 \times 50 \times 4$ (2) $49 \times 49 \times 4$ (3) $51 \times 51 \times 4$ (4) $49 \times 51 \times 4$ (.........)

14. ඊළඟ කන්නය එළැඹීමට පෙර ගොවියා කුඹුරේ පිට මායිම් නියර ඉතිරිකොට ඇතුළත නියර කපා දමා ලියැදි හතරම එක්කොට එකම ලියැද්දක් ලෙස සකස් කරන ලදී. වගා කළ හැකි ඉඩ ප්‍රමාණය කලින් තිබුණාට වඩා දැන් කවර ප්‍රතිශතයකින් වැඩි වී ඇති ද?

(1) 10% (2) 20% (3) 21% (4) 44% (.........)

15. ගොවියා තම කුඹුරේ එක් පැත්තකට මායිම් වූ එක් පැත්තක දිගට සමාන දිග ඇති මීටර 5 ක් පළල බිම් තීරුවක් මිලදී ගත්තේ නම්, දැන් මුළු කුඹුරේ ම ක්ෂේත්‍රඵලය වර්ගමීටර කීය ද?

(1) 174 (2) 234 (3) 289 (4) 324 (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් රටාවකට අනුව සංඛ්‍යා යොදන ලද සංඛ්‍යා පේළියක් බැගින් දී ඇත. එම රටාවට අනුව එක් එක් පේළියේ **?** සලකුණ සහිත ස්ථානයට යෙදෙන සංඛ්‍යාව සොයා, එම සංඛ්‍යාව ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත **ඉලක්කමෙන් පමණක්** ලියන්න.

16. 8 , 17 , 31 , 52 , ...?... (..................)

17. 4 , 9 , 20 , 43 , 90 , ...?... (..................)

18. 70 , 39 , 20 , 10 , 6 , ...?... (..................)

19. 3.30 , 10.30 , 5.30 , 12.30 , ...?... (..................)

20. 6541 , 2654 , 5265 , 6526 , ...?... (..................)

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

21. සංඛ්‍යා තුනක සාමාන්‍යය 77 කි. ඒවායින් පළමු වන සංඛ්‍යාව දෙවන සංඛ්‍යාව මෙන් දෙගුණයකි. දෙවන සංඛ්‍යාව තුන් වන සංඛ්‍යාව මෙන් දෙගුණයකි. එසේනම් පළමු වන සංඛ්‍යාව කීය ද?

(1) 33 (2) 66 (3) 77 (4) 132 (.........)

22. ව්‍යාපාරිකයෙක් රු. 60 000 ක් ගෙවා මිලදී ගත් භාණ්ඩ තොගයෙන් 1/3 ක් සියයට 30 ක පාඩුවක් ඇතිව විකුණා දැමී ය. මෙම අලෙවියෙන් කිසිදු ලාභයක් හෝ පාඩුවක් නොවීමට නම් ඉතිරි භාණ්ඩ තොගය මිලදී ගත් ගණනට වඩා කුමන ලාභ ප්‍රතිශතයක් ඇතිව විකිණිය යුතු ද?

(1) 15% (2) 30% (3) 45% (4) 60% (.........)

23. කිරි සියයට 80ක් ද ජලය සියයට 20ක් ද සහිත ලීටර 60ක් අඩංගු මිශ්‍රණයකින් ලීටර 5ක් ඉවත් කොට ඒ වෙනුවට ජලය පුරවන ලදී. නැවතත් එම මිශ්‍රණයෙන් ලීටර 15ක් ඉවත් කොට ඒ වෙනුවට ජලය පුරවන ලදී. දැන් මෙම නව මිශ්‍රණයේ අඩංගු කිරි ප්‍රතිශතය කොපමණ ද?

(1) 40% (2) 45% (3) 55% (4) 60% (.........)

[ 4 වැනි පිටුව බලන්න.

24. යුද්ධ භට කණ්ඩායමක් පැයට කිලෝමීටර 20ක වේගයෙන් ඉදිරියට ගමන් කරයි. එම භට කණ්ඩායම පිටත් වී දෙපැයකට පසු එතැනින් පිටත් වුණු තවත් භට කණ්ඩායමක් පැයට කිලෝමීටර 28ක වේගයෙන් මුල් කණ්ඩායම ගිය දෙසට ගමන් කරයි. දෙවැනි කණ්ඩායම පිටත් වූ මොහොතේ දී ම පණිවුඩකරුවෙක් එතැනින් පිටත් වී පළමුවැනි කණ්ඩායම කරා පැමිණ පණිවිඩයක් දී නොනැවතී ආපසු ගොස් දෙවැනි කණ්ඩායමට නැවත පැමිණේ. මෙසේ කණ්ඩායම් දෙක අතර පණිවිඩ ගෙන යන්නා පැයට කිලෝමීටර 40ක වේගයෙන් මෝටර්සයිකලයකින් ගමන් කළේ නම්, කණ්ඩායම් දෙක එකතු වන විට ඔහු කිලෝමීටර කීයක් ගමන් කරන්නට ඇති ද?

(1) 50 (2) 100 (3) 160 (4) 200 (………)

25. මේ වන විට පියාගේ වයසේ අවුරුදු ගණනේ ඉලක්කම් දෙකින් මුල් ඉලක්කම සහ දෙවැනි ඉලක්කම මාරු කළ විට එය පුතාගේ වයස වේ. මීට වසරකට පෙර පියාගේ වයස පුතාගේ වයස මෙන් දෙගුණයකි. මේ වන විට පුතාගේ වයස අවුරුදු කීය ද?

(1) 26 (2) 27 (3) 36 (4) 37 (………)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සොයා, එම **පිළිතුර** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත ඉලක්කමෙන් පමණක්** ලියන්න.

26. ජලය ගෙන යාම සඳහා ගොවියකු ගෝලාකාර කළගෙඩි දෙකක් යොදා ගනී. එකක් කුඩා කළයකි. අනෙක ලොකු කළයකි. ලොකු කළයේ මහත හෙවත් විෂ්කම්භය කුඩා කළයේ මහත හෙවත් විෂ්කම්භය මෙන් දෙගුණයකි. ලොකු කළයට අල්ලන ජල ප්‍රමාණය, කුඩා කළයට අල්ලන ජල ප්‍රමාණය මෙන් දළ වශයෙන් කී ගුණයක් වේ ද? (………)

27. මගේ පියාගේ වයස මගේ මවගේ වයසට වඩා අවුරුදු **6** කින් වැඩි ය. මා උපදින විට මවගේ වයස අවුරුදු 20 කි. අප තිදෙනාගේ ම වයස්වල එකතුව දැන් අවුරුදු 97 කි. දැන් මගේ වයස අවුරුදු කීය ද? (………)

28. ශීඝ්‍ර ලෙස වැවෙන පැළෑටියකි, සැල්වීනියා. එක් දිනයක් තුළ දී මෙම පැළෑටි සංඛ්‍යාව දෙගුණ වේ. මේවා එක් පැළෑටියක් දැමූ කළ එක්තරා ජලාශයක් දින 30ක දී සම්පූර්ණයෙන් වැසී යයි. පැළෑටි 2 ක් දැමීමෙන් පසු දින කීයකදී එම ජලාශය සම්පූර්ණයෙන් වැසී යයි ද? (………)

29. යුවළකට නොකඩවාම අවුරුදු 1½කට වරක් එක් දරුවකු බැගින් ලැබුණු දරුවන් 5 දෙනෙක් වෙති. වැඩිමහල් දරුවාගේ වයස මේ වන විට බාළම දරුවාගේ වයස මෙන් හත් ගුණයකි. එසේනම් බාළම දරුවාගේ දැන් වයස අවුරුදු කීය ද? (………)

30. එක්තරා පන්තියක සිටින සෑම ශිෂ්‍යයෙක් ම අනෙක් සිසුන් එකිනෙකාටත් ගුරුවරයාටත් වෙසක් කාඩ්පතක් බැගින් යැවී ය. එක් කාඩ්පතක් යැවීමට තැපැල් ගාස්තුව රුපියල් 10 කි. හුවමාරු වූ සියලුම වෙසක් කාඩ්පත් සඳහා තැපැල් ගාස්තු රුපියල් 9 000 ක් වැය වී ඇත්නම් එම පන්තියේ සිටින සිසුන් ගණන කීය ද? (………)

- අංක **31** සිට **33** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

31. එක්තරා මිනිසකු සුළු වරදකට විනිසුරුවරයකු ඉදිරිපිටට ගෙන එන ලදී. ඔහුගේ නඩුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥයා විනිසුරුට මෙසේ කිවේ ය. "ස්වාමීනි, චූදිතයා වෙනුවෙන් අනුකම්පා කරනු මැනවි. ඔහු ඔහුගේ දෙමාපියන්ගේ එකම පුත්‍රයා වන අතර ඔහු මගේ, එක කුස උපන් සහෝදරයා ද වේ." මේ අනුව නීතිඥයාට චූදිත මිනිසාගේ ඇති සම්බන්ධය කුමක් ද?

(1) පියා (2) පුත්‍රයා
(3) සහෝදරිය (4) සහෝදරයා (………)

32. හිමාලි, රෝහිණීට වඩා අවුරුදු 10 ක් බාල ය. අවුරුදු 10 ක් ගතවීමෙන් පසු පහත සඳහන් කුමක් සිදුවිය හැකි ද?

(1) ඔවුන්ගේ වයස් අනුපාතය එසේම පවතිනු ඇත.
(2) ඔවුන්ගේ වයස් අනුපාතය පහළ යනු ඇත.
(3) ඔවුන්ගේ වයස් අනුපාතය ඉහළ යනු ඇත.
(4) ඔවුන්ගේ වයස්වල වෙනස ඉහළ යනු ඇත. (………)

33. රාමන්, අබ්දුල්, මාලන්, සුරේෂ් සහ නිහාල් යන ළමයි පස්දෙනා රවුම් මේසයක් වටා වාඩිවී සිටිති. රාමන් සහ සුරේෂ් අතර වාඩි වී සිටින්නේ අබ්දුල් පමණි. සුරේෂ් වාඩිවී සිටින්නේ නිහාල්ට ළඟින් ම දකුණු පසින් ය. මාලන්ගේ වම් පැත්තෙන් වාඩිවී සිටින්නේ කවරෙක් ද?

(1) අබ්දුල් (2) සුරේෂ් (3) නිහාල් (4) රාමන් (………)

● අංක **34** සහ **35** යන ප්‍රශ්න පහත තොරතුරු මත පදනම් වේ.

✤ ජයවර්ධන යුවළට සාධනා සහ මහේල යන දරුවන් දෙදෙනෙක් සිටිති.

✤ මහේල, විජයපාල යුවළගේ දියණියක් වන නිෂානි සමග විවාහ වී සිටියි.

✤ විජයපාල යුවළගේ පුත්‍රයා වන සුසන්ත සුභානි සමග විවාහ වී ඇත.

✤ සමන් සහ චාමලී යනු සුසන්ත සහ සුභානිගේ දරුවන් ය.

✤ නිශිනි සහ කුමුදිනී යනු මහේල සහ නිෂානිගේ දූවරුන් දෙදෙනා ය.

මෙම එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

34. සාධනාට කුමුදිනීගේ නෑකම කුමක් ද?

(1) සහෝදරිය (2) දුව (3) නැනා (4) නැන්දා (………)

35. සමන්, විජයපාල මහතාගේ

(1) මුනුපුරා ය. (2) පුතා ය. (3) බෑනා ය. (4) මස්සිනා ය. (………)

● අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නය පහත දැක්වෙන වගුව මත පදනම් වේ.

✤ 2002 සිට 2010 තෙක් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන කිහිපයක නිෂ්පාදන ධාරිතාව අඩු වැඩි වී ගිය ආකාරය දැක්වෙන දත්ත ඇතුළත් වගුවක් පහත දැක්වේ.

✤ මෙහි 2002 වර්ෂය පාදක වර්ෂය = 100 ලෙස සලකා ඇත.

**කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව 2002 - 2010**

| | 2002 | 2004 | 2006 | 2008 | 2010 |
|---|---|---|---|---|---|
| තේ | 100 | 99 | 100 | 102 | 107 |
| රබර් | 100 | 105 | 120 | 141 | 169 |
| පොල් | 100 | 105 | 109 | 118 | 94 |
| වී | 100 | 92 | 117 | 136 | 150 |
| එළවලු | 100 | 114 | 118 | 145 | 146 |
| පලතුරු | 100 | 105 | 99 | 104 | 112 |

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

36. 2002 - 2010 තෙක් අඛණ්ඩ ඉහළ ම වර්ධනයක් දක්නට ලැබෙන්නේ කුමන වගාවෙහි ද?

(1) තේ (2) රබර් (3) වී (4) එළවළු (………)

37. මෙම ප්‍රස්තාරයේ දැක්වෙන ස්වරූපයේ නිෂ්පාදන වෙනස්කම් දක්නට ලැබෙන්නේ කුමන වගාවේ ද?




(1) පලතුරු (2) තේ
(3) වී (4) පොල් (………)

38. වගුවේ දැක්වෙන තොරතුරුවලට අනුව 2010 වර්ෂය වන විට කෘෂි නිෂ්පාදනවලින් ඉහළ ම ආදායමක් ලැබෙන්නට ඇත්තේ කුමකින් ද?

(1) වීවලිනි. (2) රබර්වලිනි.
(3) එළවලුවලිනි. (4) නිශ්චිතව කිව නොහැකි ය. (………)

39. පොල් නිෂ්පාදනය හැර 2002 - 2008 අතර කාලයේ අවම නිෂ්පාදන වේගයක් දක්නට ලැබෙන්නේ කුමන වගාවෙහි ද?

(1) පලතුරු (2) එළවලු (3) තේ (4) වී (.........)

40. වගුවෙහි දී ඇති 2002 - 2010 අතර දත්ත සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන වගන්තිය නිශ්චිතවම සත්‍ය වේ ද?

(1) ශ්‍රී ලංකාවේ එළවලු නිෂ්පාදනය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත.
(2) පලතුරුවලින් ලැබුණු ආදායමට වඩා එළවලුවලින් ලැබුණ ආදායම වැඩි ය.
(3) 2004 වී නිෂ්පාදනය අඩු වී ඇත්තේ නියඟය නිසා වගා පාලුවීම නිසා ය.
(4) 2010 වන විට පොල් නිෂ්පාදනය අඩු වී ඇත්තේ මිනිසුන් නිවාස තැනීමට පොල්ගස් කැපීම නිසා ය.(.........)

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නය, ඒ සමග දක්වා ඇති රූපය මත පදනම් වේ. එම රූපය අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත්** ඉර මත ලියන්න.

41. Ⓐ,Ⓑ,Ⓒ,Ⓓ,Ⓔ හා Ⓕ යන නගර හය සම්බන්ධවන ආකාරය දැක්වෙන රූපසටහනක් පහත දැක් වේ. ඊතලවලින් දැක්වෙන්නේ ගමන් කළ හැකි දිශාවන් ය.




මේ අනුව Ⓐ සිට Ⓕ දක්වා ගමන් කිරීමට එකිනෙකට වෙනස් මාර්ග කීයක් තිබේ ද?

(1) 8 (2) 9 (3) 10 (4) 11 (.........)

42. මෙහි දැක්වෙන රූපයේ අඳුරු කර ඇති කොටසේ වර්ග ප්‍රමාණය ***PQRS*** චතුරස්‍රයේ වර්ග ප්‍රමාණයෙන් කුමන ප්‍රතිශතයක් ද?

(1) 20% (2) 25%
(3) 30% (4) $33\frac{1}{3}$ %




(.........)

43. කෘෂිකර්ම විෂය උගන්වන ගුරුවරයෙක් ශිෂ්‍යයන් අතට ලණුවක් දී එයින් පහත දැක්වෙන කැමති හැඩයකට එළවලු පාත්ති සැලසුම් කරන ලෙස කීවේ ය. සෑම පාත්තියකම වටේ දිග ලණුවේ දිගට සමාන විය යුතුය.



***A*** ***B*** ***C*** ***D***

ඉහත දැක්වෙන පාත්ති හතරෙන් වැඩිම ඉඩ ප්‍රමාණයක් ඇත්තේ කුමන පාත්තියේ ද?

(1) ***A*** (2) ***B*** (3) ***C*** (4) ***D*** (.........)

44. මෙහි දැක්වෙන රූපයේ දිග සහ පැතිවල පළල දක්වා ඇත. එහි වර්ග ප්‍රමාණය වර්ගමීටර කීය ද?

(1) 1000 (2) 1200
(3) 1500 (4) 1800




(.........)

45. පහත රූපයේ ඇති සෑම චතුරස්‍රාකාර කොටුවකම පැත්තක දිග සෙන්ටිමීටර 1 කි. මෙම රූපයේ පරිමිතිය හෙවත් වටේ දිග සෙන්ටිමීටර කීය ද?



(1) 15 (2) 16
(3) 17 (4) 19 (.........)

● අංක **46** සහ **47** යන එක් එක් ප්‍රශ්නය යටතේ *A*, *B*, *C*, *D*, *E* හා *F* වශයෙන් වූ රූප හයක් බැගින් දී ඇත. ඒවා අතුරින් රූප හතරක් කිසියම් ලක්‍ෂණයකට අනුව එකිනෙකට සමාන සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. එසේ සමාන සම්බන්ධතාවක් පෙන්නුම් **නොකරන** ඉතිරි රූප දෙක තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත්** ඉර මත ලියන්න.

46.



*A* *B* *C* *D* *E* *F*

(1) *A* සහ *C* (2) *D* සහ *F* (3) *B* සහ *F* (4) *B* සහ *E* (.........)

47.



*A* *B* *C* *D* *E* *F*

(1) *B* සහ *D* (2) *A* සහ *F* (3) *D* සහ *F* (4) *D* සහ *E* (.........)

● අංක **48** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දැක්වෙන රූපවලින් එකක් අනෙක් රූපවලට වඩා වෙනස් ය. එසේ වෙනස් වන රූපය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත්** ඉර මත ලියන්න.

48.



*A* *B* *C* *D*

(1) *A* (2) *B* (3) *C* (4) *D* (.........)

49.



*A* *B* *C* *D*

(1) *A* (2) *B* (3) *C* (4) *D* (.........)

50.



*A* *B* *C* *D*

(1) *A* (2) *B* (3) *C* (4) *D* (.........)

* * *